චක්‍රලේඛ අංක : 04/2014

මගේ අංකය : බප/සසේකො/6-චක්‍රලේඛ
සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.),
121/3,
කිරුළපන මාවත,
කොළඹ 05.

2014-02-28

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති,

සභාපතිවරුන් වෙත ,

**<u>විවිධ සේවා සමුපකාර සමිති සාමාන්‍යාධිකාරීවරුන් වෙත</u>**

**<u>කළමනාකරණ අවදානම් දීමනාවක් ගෙවීම.</u>**

විවිධ සේවා සමුපකාර සමිතිවල ප්‍රධාන විධායක තනතුර උසුලන සාමාන්‍යාධිකාරීවරුන් හට, රාජකාරිමය වශයෙන් නිරන්තරයෙන් දැරීමට සිදු වන වගකීම් සහ මුහුණ දීමට සිදු වන කළමනාකරණ අවදානම් තත්ත්වයන් සැලකිල්ලට ගනිමින්, එම කළමනාකරණ අවදානම් දැරීම වෙනුවෙන් බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිතිවල සාමාන්‍යාධිකාරීවරුන් වෙත 2014-01-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, පහත සඳහන් විධිවිධානයන්ට යටත්ව කළමනාකරණ අවදානම් දීමනාවක් ගෙවීම, බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් අනුමත කර ඇත.

I කළමනාකරණ අවදානම් දීමනාව හිමි වන්නේ විවිධ සේවා සමුපකාර සමිතියක ප්‍රධාන විධායක නිලධාරි තනතුර වන සාමාන්‍යාධිකාරි තනතුර සඳහා බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ අනුමැතිය ලත්, සේවය ස්ථිර වූ නිලධාරියෙකුට හෝ නිලධාරිනියකට පමණි.

II එක් එක් සමිතියේ ආර්ථික ශක්‍යතාවය අනුව අවමය රු.3000/- සිට උපරිමය රු.5000/- දක්වා වූ කළමනාකරණ අවදානම් දීමනාව ගෙවීම පිළිබඳව සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කළ යුතුය.

III කොන්ත්‍රාත් පදනමින් පත්කර ඇති සාමාන්‍යාධිකාරීවරුන්ට හා වැඩ ආවරණය කිරීමට පත් කර ඇති සාමාන්‍යාධිකාරීවරුන්ට, මෙම දීමනාව සඳහා හිමිකම් ප්‍රකාශ කළ නොහැක.

IV විශ්‍රාම පාරිතෝෂිකය ගණනය කිරීමේ දී මෙම දීමනාව අදාල කර ගත යුතු නොවන අතර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට දායක වීම සම්බන්ධයෙන් වන කල් හි, කම්කරු නීති,රීති අනුව කටයුතු කළ යුතු වේ.

ඩබ්. පී. එම්. ජී. ආර්. ශාන්ත කුමාර මුහන්දිරම්,
ලේකම්,